**1990 සුවසැරිය පදනම - 2022**

**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

1990 සුවසැරිය පදනමේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සුවසැරිය පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ලාභ අරමුණු කර නොගත් සංවිධාන සඳහා නිර්දේශිත ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ලාභ අරමුණු කර නොගත් සංවිධාන සඳහා නිර්දේශිත ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සුවසැරිය පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සුවසැරිය පදනම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සුවසැරිය පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සුවසැරිය පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සුවසැරිය පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සුවසැරිය පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සුවසැරිය පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සුවසැරිය පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සුවසැරිය පදනම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරිතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අප්‍රේල් 24 දින සෞඛ්‍ය අමාත්‍යාංශය හා GVK EMRI Lanka (Private) Ltd ආයතනය සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම හා 2018 අංක 18 දරන 1990 සුවසැරිය පදනම ස්ථාපිත කිරීමේ පනතේ 26 (ඇ) වගන්තිය ප්‍රකාරව, සුවසැරිය පදනමේ මෙහෙයුම් කටයුතු සඳහා වැය වන පුනරාවර්තන වියදම් රජය විසින් ප්‍රතිපූරණය කළ යුතු වුවද, 2022 ජනවාරි 01 දින වන විට පැවති රු. 330,091,526 ක මුදල සමාලෝචිත වර්ෂයේදි ද ප්‍රතිපූර්ණය කර නොතිබුණි. එසේම 2019 වර්ෂය සඳහා රජය විසින් සුවසැරිය පදනමට ලබාදුන් මූල්‍ය ප්‍රතිපාදනය 2021, 2022 හා 2023 වර්ෂවලදී පිළිවෙලින් සියයට 25 ක් සියයට 50 ක් හා සියයට 75 ක් දක්වා අඩුකිරීමට 2019 අගෝස්තු 27 දින අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණු අතර මූල්‍ය ප්‍රතිපාදන අඩුකිරීමෙන් පසුව සුවසැරිය පදනම පවත්වාගෙන යාම සඳහා යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණි. නමුත් එවැනි යොජනාවක් 2023 මාර්තු 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණු අතර මෙම තත්ත්වය සුවසැරිය පදනමේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි සෘජු බලපෑමක් එල්ල විය හැකි බව නිරීක්ෂණය විය. | අදාළ සියලුම හිමිකම් හා ලිපි ලේඛන අමාත්‍යාංශ වෙත ඉදිරිපත් කර ඇති බව, අඛණ්ඩ වියදම් ප්‍රතිපූරණයකින් තොරව කාර්යක්ෂම මෙහෙයුමක් ක්‍රියාත්මක කිරීමේ දුෂ්කරතා පෙන්වා දුන් බව, 2019 අගෝස්තු 27 වැනි දින කැබිනට් පත්‍රිකාවට අනුව, එක් පැමිණීමකට ඩොලර් 02 ක් අය කිරීමට සැලසුම් ක්‍රියාත්මක වුවද දේශපාලන වෙනස් වීම් සහ අමාත්‍යාංශ වෙනස්වීම් හේතුවෙන් එය ක්‍රියාත්මක කිරිමට නොහැකි වූ බව හා කොවිඩ් 19 අර්බුදයේදී සහ ඊට පෙර මහජනතාවට ලබා දුන් සේවය සැලකිල්ලට ගනිමින්, කැබිනට් තීරණය වෙනස් කර අරමුදල් ලබා දෙන ලෙස ඉල්ලා සිටි බව, 2022 ඔක්තෝම්බර් 25 දින වත්මන් සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යවරයා සමඟ පැවති සාකච්ඡාවකදී තවත් ඉල්ලීමක් කර ඊට අදාළ සියලුම ලියකියවිලි ද භාර දෙන ලද බව, 2023 ජනවාරි වන විට භාණ්ඩාගාරයේ අයවැය හිඟය හේතුවෙන් කළමනාකරණ මණ්ඩලය 1990 සුවසැරිය ගිලන්රථ සේවාවට සහය දැක්වීමට සහ නඩත්තු කිරීමට ආයතනික සහ මහජන සහාය ලබා ගැනීමට කටයුතු කළ බව. | මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් සමඟ සාකච්ඡා කර ආයතනය බධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා සුදුසු යාන්ත්‍රනයක් කඩිනමින් ස්ථාපිත කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 9.1 වගන්තිය | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව, නිලධාරියෙක් වෙත කිලෝමීටරයට රු.2 ක සැතපුම් කුලියක් ගෙවිය හැකි නමුත්, එම විධිවිධානවලට පටහැනිව හා ආයතන අධ්‍යක්ෂකගෙන් ලබාගත් විධිමත් අනුමැතියකින් තොරව, ගිලන් රථ සේවාව අධීක්ෂණ කටයුතු වෙනුවෙන් දිස්ත්‍රික් මට්ටමින් ස්ථානගත කර තිබුණු අධීක්ෂණ නිලධාරීන්ට ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සඳහා තම පෞද්ගලික යතුරුපැදිය භාවිතා කිරීමටත් ඒ සඳහා පදනම විසින් කිලෝමීටරයකට රු.23 සිට රු. 48 දක්වා විවිධ රේටයන් 7 ක් යටතේ ගෙවීම් කිරීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව 2022 වර්ෂය තුළ අවස්ථා 191 කදී කිලෝ මීටර 295,400 ක් සඳහා රු. 9,787,851 ක් ගෙවා තිබුණි. | දිස්ත්‍රික් භාර නිලධාරීන් ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා තමන්ගේම වාහන භාවිතා කරන බව, එවැනි චාරිකා සඳහා ඔවුන්ට ඉන්ධන දීමනාවක් නොගෙවන බව, ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කිලෝමීටරයකට රු. 2 ක ගමන් දීමනාවක් ගෙවීම ප්‍රායෝගික නොවන බව, දිස්ත්‍රික් භාර නිලධාරීන් සඳහා මෝටර් සයිකල් සඳහා ආයෝජනය කිරීමට සිදුවන බව, ඊට අමතරව ඉන්ධන, රක්ෂණ, ටයර්, බැටරි, නඩත්තු ආදී වියදම් දැරීමට සිදුවන බව හා පිරිවැය ඉතිරිකිරීම් සලකා බලමින් අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරී ඇති බලතල අනුව සේවාව ඉහළ නංවා ගැනීම සඳහා ගමන් දීමනාව ලෙස පවතින ඉන්ධන මිල මත පදනම්ව කිලෝමීටරයකට රු.23 සිට රු.48 දක්වා ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇති බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අතර ආයතන අධ්‍යක්ෂකගෙන් ලබාගත් විධිමත් අනුමැතියකින් තොරව මෙවැනි දීමනා නොගෙවිය යුතුය. |
| (ආ) 2021 නොවැම්බර් 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ ආයතනික මාර්ගෝපදේශ සංග්‍රහය/ අත්පොත | | | |
| (i) මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 ඡේදය | ජාතික ප්‍රතිපත්ති රාමුවක් තුළ ආයතන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උපායමාර්ගික සැලැස්මක් පිළියෙල කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් | 2021 වසර කොවිඩ් 19 වසරක් වූ අතර එහිදී මෙහෙයවන ලද එදිනෙදා හදිසි අවස්ථා වලට අමතරව | මාර්ගෝපදේශ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | සහතික විය යුතු අතර එම සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික අයවැය ලේඛනය සමඟ අමාත්‍යාංශයේ ලේකම් හරහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතු වුවද සුවසැරිය පදනම විසින් එසේ සිදුකර නොතිබුණි. | කොවිඩ් 19 රෝගීන්ගේ ජීවිත බේරා ගැනීමට රජයට සහාය වීම කෙරෙහි පූර්ණ අවධානය යොමු කළ බව, 2022 වසර මෙහෙයුම් කරගෙන යාමට මුදල් සොයා ගැනීමටත්, ඖෂධ සඳහා ආධාර ලබා ගැනීමටත්, සේවාව පවත්වාගෙන යාමට ඉන්ධන ලබා ගැනීමටත් සෑම දිනකම අරගල කළ බව, සේවාවන් ක්‍රියාත්මක වන බව සහතික කර ගැනීම සඳහා සියලුම කාර්ය මණ්ඩලයට වැඩිපුර වැඩ කිරීමට සිදුවූ බව, 2023 වසරේදී නැවතත් බිලියන 1.4ක අයවැය හිඟයකට සහ දැවැන්ත කාර්ය මණ්ඩල හිඟයකට මුහුණ දී සිටින බව, 1990 සුවසැරිය පදනමේ එකම අවධානය ජීවිත බේරා ගැනීම බව, කෙසේ වෙතත්, අපට අපගේම අභ්‍යන්තර උපායමාර්ගික සැලැස්මක් ඇති බව. | |
| (ii) | මාර්ගෝපදේශ සංග්‍රහයේ 5 ඡේදය | සුවසැරිය පදනම විසින් වාර්ෂික අයවැය ලේඛනය පිළියෙළ කිරීමේදී ඇමුණුම I හි 3 (a) හි සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි. | 2023 වර්ෂය සඳහා අයවැයගත ආදායම් ප්‍රකාශය සහ ප්‍රාග්ධන වියදම් සඳහා අයවැය සකස් කර ඉදිරිපත් කර ඇති බව, 2023 වර්ෂය සඳහා අයවැයගත මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සහ අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් නොකළ බව හා අනාගතයේදී අදාළ මාර්ගෝපදේශ අනුව කටයුතු කරණ බව. | මාර්ගෝපදේශ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 293,067,249 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 51,365,905 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 344,433,154 ක

වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සුවසැරිය පදනමේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙහි හුවමාරු අගය වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ මිලදී ගෙන 2021 දෙසැම්බර් 30 දින සුවසැරිය පදනම වෙත ලබාදී තිබුණු වටිනාකම පිළිබඳ නිශ්චිත තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණු ගිලන් රථ 25 භාවිතයට ගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණු අතර මෙම ගිලන් රථ මෙම පදනම විසින් සපයනු ලබන සේවාවන්වලට ගැලපෙන පරිදි වැඩිදියුණු කිරීමේ කටයුතු අවසන් නොකිරීම හේතුවෙන් සැපයුම්කරුගේ රථ ගාලක් තුළ නවතා තිබුණි. | මෙම ගිලන්රථ මිලදී ගෙන ඇත්තේ රෝහල් සත්කාරක ගිලන් රථයක් සඳහා අවශ්‍ය පිරිවිතර විමසීමකින් හෝ 1990 සුවසැරිය පදනමේ කිසිදු පුද්ගලයෙකු තාක්ෂණික ඇගයීම් කමිටුවට පත් කිරීමකින් තොරව බව, වෑන් රථ රෝහල් සත්කාරක ගිලන්රථ ලෙස පරිවර්තනය කිරීම සහ වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා ප්‍රාග්ධන වියදම් සඳහා මුදල් නිකුත් කිරීම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ඉල්ලීම් කිහිපයකින් පසුව සිදු කරන ලද බව. | වැඩිදියුණු කිරීමේ කටයුතු කඩිනමින් නිමකර මෙම ගිලන් රථ ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 දෙසැම්බර් 31 දිනට සුවසැරිය පදනමේ අනුමත කාර්ය මණ්ඩලය 1,992 ක් වූ අතර, එදිනට තත්‍ය කාර්ය මණ්ඩලය 1,307 ක් විය. ඒ අනුව කාර්ය මණ්ඩල ඌනතාවය 685 ක් වූ අතර, ඒ අතරින් 321 දෙනෙකු ගිලන් රථ රියදුරන් විය. | මුළු සේවක සංඛ්‍යාව සම්පූර්ණ කිරීමට අවශ්‍ය වුවද රජයේ රෙගුලාසිවලට අනුව අපගේ සියලුම බඳවා ගැනීම් නතර කිරීමට අපට සිදු වූ බව, 2023 ජනවාරි 09 වන දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයාට පිටපත් සහිතව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාට දන්වා, සේවාව අඛණ්ඩව පවත්වාගෙන යාමට අවම වශයෙන් කාර්ය මණ්ඩලය 1661 ක් අවශ්‍ය බව දන්වා සිටියද එය 1,312 දක්වා අඩුකර ඇති බව, 2023 වර්ෂය සඳහා වැටුප් සඳහා වෙන් කර ඇති මුදලින් කාර්ය මණ්ඩලය 1,661 කගේ වැටුප් කළමනාකරණය කළ හැකි බව ද දැනුම් දෙන ලද බව, | අත්‍යවශ්‍ය සේවකයින් බඳවා ගැනීමටත්, අත්‍යවශ්‍ය නොවන තනතුරු යටපත් කර අනුමත කාර්යමණ්ඩලය සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඉහල කළමනාකරණ තනතුරක් වූ මූල්‍ය ප්‍රධානි (Head of Finance) තනතුර සඳහා අනුමත කාර්යමණ්ඩලයට ඇතුළත් නොවූ මූල්‍ය උපදේශකයෙකු ලෙස නිලධාරියෙකු මාස 06 ක කාලයක් සඳහා 2021 සැප්තැම්බර් 02 දින කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු අතර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. පත්කිරීම් කොන්දේසි ප්‍රකාරව තවත් මාස 06කට පමණක් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කළ හැකි වුවද 2023 අප්‍රේල් 19 දින දක්වා තවත් වැඩිපුර මාස 06 ක කාලයකින් මොහුගේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. එසේම මූල්‍ය හා සැපයුම් දාම කළමනාකරු තනතුර දරන නිලධාරිණිය හට ද 2021 අගෝස්තු 21 දින සිට එක් වසරක පරිවාස කාලයකට යටත්ව වැඩබලන මූල්‍ය ප්‍රධානි තනතුර සඳහා උසස්වීමක් ලබා දී තිබුණු අතර පත්කිරීම් කොන්දේසි ප්‍රකාරව එම නිලධාරිනිය විසින් මූල්‍ය ප්‍රධානී තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් වර්ෂයක් ඇතුළත සම්පූර්ණ කරගත යුතු අතර පරිවාස කාලය මාස 03 ක් දක්වා දිර්ඝ කළ හැකි විය . නමුත් විධිමත් අනුමැතියක් රහිතව එම නිලධාරිනිය 2023 මාර්තු 31 දින වන විටත් මූල්‍ය ප්‍රධානි තනතුරේ වැඩ බැලීම සිදු කරන බව නිරීක්ෂණය විය. | සම්මුඛ පරීක්ෂණ මාලාවකින් පසු, මූල්‍ය ප්‍රධානි තනතුරෙහි අවශ්‍යතා සම්පූර්ණ කිරීමට කිසිදු අපේක්ෂකයෙකු නොසිටි බැවින් වසරක කාලයක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට අනුව උපදේශකයෙකු බඳවා ගන්නා ලද බව, ඒ අතරම, මූල්‍ය මෙහෙයුම් සුමටව පවත්වාගෙන යාම සඳහා මූල්‍ය හා සැපයුම් දාම කළමනාකරු වැඩ බලන මූල්‍ය ප්‍රධානියා ලෙස උසස් කළ බව, රජය විසින් බඳවා ගැනීම් නතර කර ඇති බැවින්, එම පුද්ගලයා නියමිත සුදුසුකම් සම්පූර්ණ කර නොමැති වුවද, වැඩබලන මූල්‍ය ප්‍රධානී තනතුර දිගටම කරගෙන යාමට පදනමට සිදුවූ බව, බඳවා ගැනීම ආරම්භ කිරීමට රජය අවසර දුන් විට වැඩ බලන පුද්ගලයා වෙනුවෙන් කළ යුතු දේ තීරණය කරන බව. | සියළුම පත් කිරීම් විධිමත් අනුමැතීන් යටතේ පමණක් සිදුකළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක PFD/RED/01/04/2014/01 දරන රාජ්‍ය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව දිගුකාලීන දැක්මක් සහිතව අදාළ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සඳහා චක්‍රලේඛයේ (අ), (ආ), (ඇ), (ඉ) සහ (ඊ) යන කරුණු ඇතුළත් කර නොතිබුණි. | 2022 වර්ෂය සඳහාවූ ක්‍රියාකාරී සැලැස්ම 2021 නොවැම්බර් 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල ඇමුණුම I යටතේ ලබා දී ඇති අවශ්‍යතාවය සහ මාර්ගෝපදේශ අනුව ඉදිරිපත් කරන ලද බව, ඉදිරියේදී චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුය. |

## 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 සහ 2019 ජනවාරි 12 දිනැති අංක ඩීඑම්ජී/1-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව සුවසැරිය පදනම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් මෙම ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇති බව සහ 2022 වර්ෂයේදීද මෙම ඉල්ලීම පිළිබඳ අමාත්‍යාංශය හරහා කළමනාකරණ සේවා දෙපාර්මේනතුව වෙත දන්වා යවා තිබුණද මේ වන තෙක් ප්‍රතිචාර දක්වා නොතිබුණු බව, විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශය අනුව, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා විසින් 2023 වසර සඳහා අභ්‍යන්තර විගණන සැලැස්මට 1990 සුවසැරිය පදනම ඇතුළත් කර ඇති බව. | නීතිරීති ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදුකිරීමට කටයුතු කළ යුතුය. |